අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01

අතිගරු ජනාධිපතිතුමනි,

<u>ආගමික පදනම මත යම් කොටස් විසින් ප්‍රචණ්ඩත්වය දියත් කිරීම</u>

පසුගිය දෙදිනතුල නුවර ප්‍රදේශයේ තෙල්දෙණිය අවට ප්‍රදේශවල ආගමික පදනම මත ඇතිවුණු සාහසික ක්‍රියා හා එයින් ජනතාවට සිදු වුණු ජීවිත හානි, දේපල හානි හා දැඩි පීඩනය පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව සිය දැඩි කම්පනය හා කනස්සල්ල පළ කර සිටියි. එමෙන්ම මෙම ඛේදජනක සිදුවීම් නිසා අකාලයේ ජීවිත අහිමි වුණු සහෝදර පුරවැසියන් වෙනුවෙන් අපි බලවත් ශෝකය පළ කර සිටින්නෙමු.

මෙම සිද්ධියෙන් පිළිඹිබු වන්නේ පසුගිය මාස කීපය තුලදී වෙනත් ප්‍රදේශවල, එනම් දකුණු පළාතේ ගිංතොට හා නැගෙනහිර පළාතේ අම්පාර යන ප්‍රදේශවල සිදු වුණු ආගමික පදනම මත ඇතිවුණු හෝ ඇති කළ ජනකොටස් අතර ආගමික වෛරය පතුරුවන ප්‍රචණ්ඩකාරී සිදුවීම් රටාවයි. එහෙයින් මෙම සිද්ධිය හුදෙක්ම හුදකලා සිද්ධියක් ලෙස අපට සැලකිය නොහැක.

මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් සිදු කළ මූලික විමර්ශන වලින් අපට නිරීක්ෂණය වන්නේ අහඹු සිදුවීමක් පදනම් කරගෙන අදාළ ප්‍රදේශයෙන් පිටස්තර වූ කොටස් එම ප්‍රදේශයේ ජනතාව ආගමික පදනම මත භේදභින්න කිරීමට සැලසුම් සහගතව කටයුතු කර ඇති බවයි. අප නිලධාරීන්ගේ නිරීක්ෂණය වී ඇත්තේ දිගන ප්‍රදේශයේ දි පෙබරවාරි මස 22 වන දින සිදු වූ පහරදීමකින් අවාසනාවන්ත ලෙස මිය ගිය පුද්ගලයාගේ අවට ගම්මාන වල මුස්ලිම් හා සිංහල ජනකොටස් අතර ,තවමත් සුහද සම්බන්ධතා පවතින බවයි. නමුත් යම් සංවිධානගත පිටස්තර කොටස් විසින් සිදු කරනු ලබන උසි ගැන්වීම හා සාපරාධී ක්‍රියා නිසා මේ පළාතේ ජනකොටස් අතර භීතිය, අසමගිය හා වෛරය පැතිරවීමට කටයුතු සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය වේ.

මෙම ආගමික භේද භින්න කිරීම් මෑතකදි ආරම්භ වූයේ 2014 වසරේදී අලුත්ගම නගරය අවට ආගමික පදනම මත ඇති කළ කෝලාහලයයි. ඉන් පසු රටෙ ස්ථාන කිහිපයකදීම ආගමික පදනම මත ගැටුම් විටින් විට ඇති වුණ බව අප නිරීක්ෂණය කළෙමු. එමෙන්ම පසුගිය වසර කිහිපය පුරා යම් සමාජ වෙබ් අඩවි මගින් ඉතාමත්ම සැලසුම් සහගත ලෙස ආගමික පදනම් මත ජනතාව අතර සැකය හා වෛරය ඇතිවන ආකාරයෙන් වෛරී ප්‍රකාශන නිකුත් කිරීම නිරන්තරයෙන් සිදු වෙමින් පවතී. මෙහිදී යම් යම් ආගමික සිද්ධස්ථානවලට හා වෙළඳ ව්‍යාපාරවලට එරෙහිව ප්‍රචණ්ඩත්වය දියත් කිරීම සඳහා සෘජු පෙළඹවීම් ද අප හට දිගින් දිගටම දක්නට ලැබෙ. ඒ පිළිබඳව අප 2017 මැයි මස 31 වෙනි දාතමින් යුතු ලිපියෙන් අප ඔබතුමාට කොමිෂන් සභාවෙ කනස්සල්ල පළ කර සිටි අතර වෛරී හා ප්‍රචන්ඩකාරී කථනයන් 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබද ජාත්‍යන්තර ප්‍රඥප්තිය ආශ්‍රිත පනත හා ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහ විධිවිධාන යටතේ අපරාධ ලෙස සැලකෙන ක්‍රියාවන් වන බැවින්,


ප්‍රධාන කාර්යාලය
தலைமைக் காரியாலயம்
Head Office
14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.
14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
14, R.A.De Mel Mawatha, Colombo - 04.

දුරකථන
தொலைபேசி
Telephone
94-11- 2505580/81/82

සභාපති
தவிசாளர்
Chairperson
011-2505451

ලේකම්
செயலாளர்
Secretary
011-2505521

ෆැක්ස්
தொலைநகல்
Fax
011 2505541/74

ක්ෂණික
துரித அழைப்பு
Hotline
011-2505575
1996

විද්‍යුත් තැපෑල
மின்னஞ்சல்
E-mail
sechrcsl@gmail.com

වෙබ්
இணையம்
Web
www.hrcsl.lk

වෛරී කථනයක් සිදු කරන පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය අපි අවධාරණය කර සිටියෙමු.

ඉහත සඳහන් පරිදි මෙ සිදුවන ආගමික වෛරය මත පදනම් වූ ප්‍රචණ්ඩකාරී සිද්ධිදාමයන් හා වෛරී කථනයන් සැලකිල්ලට ගනිමින් එම ක්‍රියාවලට ඍජුවම සම්බන්ධ වුණු පුද්ගලයින්ට පමණක් නොව ඔවුනට අනුබල දෙන්නා වූ සියල්ලන්ටම එරෙහිව වාර්ගික, ආර්ථික, දේශපාලන හෝ සමාජ තරාතිරම නොතකා දැඩි ලෙස නොපැකිලව කටයුතු කිරීමේ අවශ්‍යතාවය රාජ්‍ය නායකයා වන ඔබතුමාට ගෞරව පූර්වකව සැලකර සිටිමු.

විශේෂයෙන්ම, මෙහිදී අවධාරණය කළ යුතු කරුණක් වන්නේ ඉහත කී 2017 අංක 56 දරණ පනතේ 3 වන වගන්තිය යටතේ පිළිගෙන ඇති අපරාධයක් වන "කිසිදු තැනැත්තකු විසින්, යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට, එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියා වලට යොමු කිරීම සංයුක්ත වන ජතික, වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පෙළඹවීම" යන ප්‍රතිපාදනය යටතේ අදාළ පුද්ගලයන්ට විරුද්ධව කටයුතු කිරීමේ අවශ්‍යතාවයයි.

ඔබතුමා විසින් පෙරදින සවස ජාතිය අමතා අදාළ පුද්ගලයන්ට එරෙහිව නීතිය මගින් දැඩිව කටයුතු කරන්නේ යැයි දුන් ප්‍රතිඥාව අප කොමිෂන් සභාව බෙහෙවින් අගය කරමු. එම නිසා, මෙම සිද්ධි වලට වගකිවයුතු සියල්ලන්ටම, විශේෂයෙන්ම මෙවැනි සිද්ධීන්ට අනුබල දෙන හා සංවිධානාත්මක ශක්තියෙන් පෝෂණය කරන පුද්ගලයන්ට, එරෙහිව වහාම නීතිය යටතේ දැඩි පියවර ගනු ඇතැයි අපි තරයේ විශ්වාස කරමු.

සභාපතිනී
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka